කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
விவசாயத் திணைக்களம்
DEPARTMENT OF AGRICULTURE

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය
பீடைகொல்லி பதிவு அலுவலகம்
Office of the Registrar of Pesticides

අංක 1056, ගැටඹේ, තැ.පෙ. 49, පේරාදෙණිය 20400, ශ්‍රී ලංකාව
இல 1056, கெடம்பே, த.பெ.இல 49, பேராதனை 20400, இலங்கை
No. 1056, Getambe, P.O. Box 49, Peradeniya 20400, Sri Lanka

දුරකථන/தொலைபேசி/Telephone : (94)812388076/388135
ෆැක්ස්/தொலைநகல்/Fax : (94)812388135
ඊ මේල්/மின்னஞ்சல்/E-mail : pest@slt.lk
වෙබ්/மின்னஞ்சல்/Web : www.doa.gov.lk

මගේ අංකය / எனது எண் / My No: RP/VIII/A$_1$ | ඔබේ අංකය / உமது எண் / Your No: | දිනය / திகதி / Date: 2019.12.31

චක්‍රලේඛ අංක: RP/AUO/2019-3

අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු)

පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්
(මධ්‍යම, වයඹ, උතුරුමැද, නැගෙනහිර, ඌව, සබරගමුව, උතුර, දකුණ, බස්නාහිර)

අධ්‍යක්ෂ (කෘෂිකර්ම), ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

මගින්

සියළුම බලයලත් නිලධාරිවරුන් වෙත.

## 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත

## නීති විරෝධී පළිබෝධනාශක සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග සිදුකිරීමේ දී විශ්ලේෂණ වාර්තා ලබාගැනීම

නීති විරෝධී පළිබෝධනාශක සම්බන්ධයෙන් සිදුකරන අධිකරණ ක්‍රියාමාර්ග සඳහා රසායන විශ්ලේෂණයක් සිදුකිරීම මගින් "පළිබෝධනාශක" බව නෛතිකව ඔප්පු කිරීම 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 21 (2) (ආ) වන උප වගන්තිය ප්‍රකාරව අවශ්‍ය වේ. ඒ සඳහා උක්ත 21 (2) (ආ) වන උප වගන්තිය ප්‍රකාරව බලයලත් නිලධාරිවරුන් විසින් සාම්පල 3 ක් සකසා ඉන් එක් සාම්පලයක් "බලයලත් විශ්ලේෂකයෙකු" වෙත යොමුකර අදාල රසායන විශ්ලේෂණ වාර්තාව ගරු අධිකරණයට ඉදිරිපත් කළ යුතුය.

02. උක්ත පනතේ 27 වන වගන්තිය යටතේ "බලයලත් විශ්ලේෂකයෙකු" වශයෙන් අංක 1293/21 සහ 2003.06.19 දින රජයේ අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාර රසායන විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙත වර්තමානයේ පහසුකම් නොමැති බැවින් අධිකරණ ක්‍රියාමාර්ග සඳහා සාම්පල ඉදිරිපත් කිරීමේ දී <u>පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙත විශ්ලේෂණ සාම්පල යොමු නො කළ යුතු අතර</u> ඒ සඳහා උක්ත පනතේ 27 වන වගන්තිය යටතේ "බලයලත් විශ්ලේෂක" වශයෙන් අර්ථ නිරූපණය කර ඇති පහත සඳහන් විශ්ලේෂණාගාර වෙත කෙලින්ම සාම්පල යොමුකර අදාල රසායන විශ්ලේෂණ වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතු බව මෙයින් දන්වා සිටිමි.

අ. රජයේ රස පරීක්ෂකවරයා (Government Analyst)

ආ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මධ්‍යම කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේ රසායන විද්‍යාඥයා (දැනට ක්‍රියාත්මකව පවතින කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නෝරුව පිහිටි උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ ස්ථාපිත මධ්‍යම විශ්ලේෂණාගාරයේ ප්‍රධාන රසායන විද්‍යාඥ) (Central Laboratory, Horticultural Research & Development Institute)

ඇ. ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනයේ රසායන විද්‍යාඥ (දැනට ක්‍රියාත්මකව පවතින කාර්මික තාක්ෂණ ආයතනය) (Industrial Technology Institute)

ඈ. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ රසායන විද්‍යාඥ (Sri Lanka Standard Institution)

03. මතුවිය හැකි අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා විශ්ලේෂණ සාම්පල "බලයලත් විශ්ලේෂකයෙකු" වෙත යොමු කිරීමට පෙර නියමිත සංඝටක සඳහා විශ්ලේෂණ පහසුකම් හෝ ක්‍රමවේදය පවතින බවට පූර්ව විමසීමක් සිදුකිරීම සුදුසු බව අවධාරණය කරමි.

04. බලයලත් නිලධාරීන් සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 27 වන පිටුවේ සඳහන් සාම්පල අංක කිරීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් සියළුම විශ්ලේෂණ සාම්පල අංකනය සිදු කර ඉන් පළමු සාම්පලය (උදා: KU/MA/NA/15/2-1) "බලයලත් විශ්ලේෂක" වෙත ද දෙවන සාම්පලය (උදා: KU/MA/NA/15/2-2) පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙත ද <u>ලිඛිතව යොමු කර</u> තුන්වන සාම්පලය (උදා: KU/MA/NA/15/2-3) සැකකරු වෙත ලබා දිය යුතුය.

05. තවද, සියළුම රසායන විශ්ලේෂණ වාර්තාවන් සාම්පල අංකයෙන් නිකුත් වී ඇති බවට තහවුරු කර ගැනීම නීති කෘත්‍යයන් විධිමත් පරිදි පවත්වා ගැනීම සඳහා අත්‍යාවශ්‍ය වේ.

ආචාර්ය ජේ.ඒ. සුමිත්
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්

පිටපත්:
1. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් – කා.දැ.ස.
2. රජයේ රස පරීක්ෂක, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව – කා.දැ.ස.
3. අධ්‍යක්ෂ, කාර්මික තාක්ෂණ ආයතනය – කා.දැ.ස.
4. අධ්‍යක්ෂ, උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය – කා.දැ.ස.
5. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය– කා.දැ.ස.
6. අධ්‍යක්ෂ (බී.ස.පැ.සං.) – කා.දැ.ස.
7. සියළුම දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් – කා.දැ.ස.
8. අභ්‍යන්තර විගණක – කා.දැ.ස.
9. එස්.එන්.එල්. රත්නවීර මහතා (ස.කෘ.අ.) – කා.දැ.ස. අවශ්‍ය සම්බන්ධීකරණය සහ පසුවිපරම් සිදුකිරීම සඳහා